**ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 22 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ අංක ඒසීඒ-5 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුළ ලද අත්තිකාරම් මුදලට වඩා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව අත්තිකාරම් ලැබීම් ලෙස රු.225,840ක් වැඩියෙන් දක්වා තිබුණි. | සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් ඍජුව වියදම් සිදුකර තිබුණි. නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) වර්ෂය අවසාන වන විට ඉදි කිරීම් නිම කළ යුතුව තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීම් එලෙස නිමකර නොතිබුණ ද, ඒ වෙනුවෙන් චෙක්පත් ලියා අත රඳවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් රු. 10,389,739ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයහපත් කාලගුණය හේතුවෙන් නියමිත කාලය තුළ කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. වර්තමානයේ කාර්යයන් අවසන් කර ගෙවීම් සිදුකර ඇත. | නිම කළ කාර්යයන්හි සහතික කළ වැඩ වටිනාකම ගිණුම්ගත කළ යුතු අතර අවසන් කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කිරීම. |
| (ඇ) භාණ්ඩාගාර පොත් අනුව 2020 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණු ශේෂයට වඩා රු.17,532,651ක් අඩුවෙන් එම වත්කම් ශේෂය ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| **(අ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | | | | |
| (i) | 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛය | 141,055 | වෙන්කළ වාහන සඳහා අමතර ඉන්ධන, ඉන්ධන ඇණවුම් මගින් ලබාගෙන තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | 97,305 | ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ නොකර අතිකාල දීමනා ගෙවා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (ii) මාර්ගෝපදේශය | 5,980,400 | අනුමත රු. 200,000ක සීමාව ඉක්මවා ග්‍රාමීය සංවිධාන 35ක් වෙත අත්තිකාරම් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ මාර්ගෝපදේශ අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව ක්‍රියාකළ යුතු වේ. |

## 2.2 අවිධිමත් ගනුදෙනු

---

අනුමත නොකළ ගනුදෙනු

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුදුකුඩියිරුප්පු හා ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු.3,256,460ක වවුචර් 08ක් සඳහා මුදල් රෙගුලාසි 137 පරිදි ලබාගත යුතු අනුමැතිය රහිතව ගෙවීම් සිදුකර තිබුණි. | වර්තමානයේ නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අත්හිටවූ, විශ්‍රාම ගිය, සේවය අත්හැර ගිය හා මියගිය නිලධාරීන්ගේ සේවක ණය ශේෂ එකතුව රු.321,560 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව පසුගිය වර්ෂ 05 සිට 26ක කාලයක් දක්වා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුගේ හිඟ ණය අයකරනු ලබන අතර අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂ පිළිබඳව අදාළ අමාත්‍යාංශ හා භාණ්ඩාගාරය වෙත විස්තර යවා ඇත. | හිඟ ණය නියමිත කාලපරිච්ඡේදය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. |

## 2.4 අනෙකුත් අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම්

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වී මිල දී ගැනීම වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවල දී විවිධ සේවා සමූපකාර සමිති 02කට ලබා දුන් රු. 17,929,775ක අත්තිකාරම් මුදලක් වර්ෂ 05කට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ආපසු ලබාගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. | අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම. |

## 2.5 තැන්පතු ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදි කිරීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්තුවක් අවලංගු කර තිබුණ ද, එම කොන්ත්‍රාත්තුව සඳහා 2018 වර්ෂයේදී ලබාගත් රු. 1,458,504ක රඳවුම් මුදල ආදායමට බැරකර නොතිබුණි. එමෙන්ම, වී මිල දී ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේදී ලද රු. 1,800,000ක් නිරවුල් කිරීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | තැන්පතු සඳහා වූ අග්‍රිම මුදල් ලැබී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිමකිරිමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුදුකුඩියිරුප්පු, මුහුදුපත්තුව (Maritimepattu) සහ වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සපිරිගම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ එකතුව රු. 8,882,950ක් වූ ව්‍යාපෘති 07ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. | වර්තමානයේ ඇතැම් කාර්යයන් අවසන් කර ඇත. අනෙකුත් ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත. | නියමිත කාල වකවානු තුළ අවසන් නොකරන ව්‍යාපෘති වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව කාල ප්‍රමාදය සඳහා දඩ අයකළ යුතු වේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආපදා කළමනාකරණ කටයුතු වෙනුවෙන් තුනුක්කායි සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 2019 වර්ෂයේදී ලබා දුන් ජල බවුසර් 02ක් මේ දක්වාම භාවිතයට ගෙන නොතිබිණි. මෙම වාහනවලට අදාළ රක්ෂණ සහතික සහ ආදායම් බලපත්‍ර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අළුත්වැඩියා කිරීමටත් ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමටත් පියවර ගෙන ඇත. | අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතු අතර ආදායම් බලපත්‍රය සහ රක්ෂණ සහතිකය ලබාගැනීමට ද පියවර ගත යුතු වේ. |
| (ආ) ට්‍රැක්ටරයක්, වර්ෂ 05ක කාලයක සිට අභාවිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණු අතර එහි හිමිකාරිත්වය පවරා ගැනීමට ද පියවර ගෙන නොතිබුණි. | කටයුතු කරමින් පවතී. | හිමිකාරිත්වය ලබා ගැනීමටත්, ඵලදායී ලෙස භාවිතා කිරීමටත් පියවර ගත යුතු වේ. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුදුකුඩියිරුප්පු, ඔඩ්ඩුසුඩාන් සහ වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් 09දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තබා නොතිබුණි. | ඇප තැන්පත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක 703ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 215ක් හා එක් නිලධාරියෙකුගේ අතිරික්තයක් පැවැතුණි. | පියවර ගනිමින් පවතී. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත නිලධාරින් එලදායී ලෙස අනුයුක්ත කිරීමටත් පියවර ගැනීම. |